ස.සේ.කො චක්‍රලේඛ : 01/2026

මගේ අංකය : NWP/CEC/1/Cir/1
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ),
දෙවන මහල,
නව පළාත් සභා ගොඩනැගිල්ල,
කුරුණෑගල.
2026.03.24

වයඹ පළාතේ සියලුම සමුපකාර සමිති,
සංගම් හා මණ්ඩලවල,
ගරු සභාපති/සාමාන්‍යාධිකාරී/කළමනාකරු.

## බඳවා ගැනීමේ ක්‍රමවේදය හා සම්මුඛ පරීක්ෂණවලදී ලකුණු ගණනය කිරීම.

වයඹ පළාතේ සමුපකාර සමිති, සංගම් හා මණ්ඩලවල අනුමත තනතුරුවලට ස.සේ.කො චක්‍රලේඛ 02/2025 අනුව සේවකයින් බඳවාගැනීමේදී මෙහි සඳහන් උපදෙස් හා ක්‍රමවේද අනුගමනය කළ යුතු බවට සමුපකාර සේවක කොමිෂන් සභාවේ 2026.03.10 දිනැති අංක 149/2026 දරණ තියමය පරිදි මෙයින් දන්වනු ලැබේ. මෙම විධිවිධාන 2026.05.01 දින සිට ක්‍රියාත්මක වන අතර මේ දක්වා ක්‍රියාත්මකව පැවැති ස.සේ.කො.03/2022 (සම්මුඛ පරීක්ෂණ) චක්‍රලේඛය ද 2021.10.21 දිනැතිව නිකුත් කර ඇති ස.සේ.කො.උපදෙස් ලිපි අංක 01-2021 යන ලිපිය ද මෙයින් අවලංගු කෙරේ.

02. ස.සේ.කො.චක්‍රලේඛ 02/2025ට අනුව සමුපකාර සමිති සඳහා අනුමත තනතුරුවලට සේවකයින් බඳවා ගැනීමේදී එම චක්‍රලේඛයේ සඳහන් සුදුසුකම් පරිදි අභ්‍යන්තර සේවකයින්ගෙන් අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් සිදු කළ යුතුය. සමිතිය අභ්‍යන්තරයෙහි අදාළ තනතුරු සඳහා සුදුසුකම් සහිත සේවකයින් නොමැති අවස්ථාවකදී මෙහි සඳහන් ක්‍රමවේදයන් අනුගමනය කර බාහිරින් අයදුම්පත් කැඳවා බඳවා ගැනීම් සිදු කළ යුතුය.

2.1 ස.සේ.කො.02/2025 චක්‍රලේඛයේ සඳහන්ව ඇති උපරිම සහ අවම වයස් සීමාව, අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, අයදුම්පත් කැඳවීමට අදහස් කරන බල ප්‍රදේශය, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය, තනතුරට අදාළ වැටුප් පරිමාණය සහ අදාළ වෙනත් තොරතුරු ඇතුළත් සවිස්තර දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කර අයදුම්පත් කැඳවිය යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී එම දැන්වීම ප්‍රසිද්ධ කළ බවට ලිඛිත තහවුරුවක් ඉදිරිපත් කළ යුතුය.

2.2 ලැබී ඇති අයදුම්පත් අදාළ සමිතියේ සාමාන්‍යාධිකාරී, මානව සම්පත් කළමනාකරු හා පහත සඳහන් අය අතුරින් එක් අයෙකුගෙන් සමන්විත කමිටුවකින් මූලික සුදුසුකම් පරීක්ෂා කර එම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය/කාරක සභාව වෙත යොමු කර සම්මුඛ පරීක්ෂණයට අදාළ ඉදිරි කටයුතු කළ යුතුය.

1.අධ්‍යක්ෂ මණ්ඩල/කාරක සභාවේ සාමාජිකයෙක්
2.දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ නිලධාරී (ස.සං.ප්‍රා.නි.)

2.3 තනතුරු සඳහා බඳවා ගැනීමේදී පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා අයදුම්පත් 20ක් හෝ ඊට අඩුවෙන් ලැබී ඇති අවස්ථාවක සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරා ගැනීම සිදු කළ යුතුය. පුරප්පාඩු සංඛ්‍යාව ඉක්මවා 20ට වැඩියෙන් අයදුම්පත් ලැබී ඇති අවස්ථාවකදී තරඟ විභාගයක් පවත්වා එක් එක් විෂයට ලකුණු 40ට වඩා වැඩියෙන් ලබා ගන්නා අයදුම්කරුවන් විභාග අංක අනුපිළිවෙල අනුව ලේඛනගත කොට සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

2.4 සුදුස්සන් තෝරා ගැනීම සඳහා විභාගයක් පැවැත්වීමට අවශ්‍ය වන අවස්ථාවලදී ස.සේ.කො.04/2024 චක්‍රලේඛයේ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

2.5 ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණය යන දෙකම පැවැත්වීමට සිදු වන අවස්ථාවක අයදුම්කරුවන් ලිඛිත විභාගයෙන් ලබා ගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණුවල එකතුවෙන් ඇමුණුම 01 පරිදි සකස් කරනු ලබන ප්‍රමුඛතා ලේඛනයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීම සිදු කළ යුතුය. ලිඛිත විභාගයේ ලකුණු සම්මුඛ පරීක්ෂණයට පෙර ප්‍රසිද්ධ නොකළ යුතුය.

2.6 විභාගයක් නොපවත්වන අවස්ථාවකදී සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණු ඇතුළත් කොට ඇමුණුම 02හි සඳහන් පරිදි ප්‍රමුඛතා ලේඛනය සකස් කළ යුතුය.

2.7 ප්‍රමුඛතා ලේඛනය මත වරින් වර බඳවා ගැනීම් කිරීමට සිදු වන්නේ නම් කොමිෂන් සභාව විමසා කටයුතු කළ යුතුය.

03. සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ක්‍රමවේදය අනුව ලකුණු ලබා දිය යුතු අතර එක් එක් සුදුසුකම සඳහා ලකුණු ගණනය කළ යුතු ආකාරය **උප ලේඛන** 01හි දක්වා ඇත.

| | සලකා බලන අතිරේක සුදුසුකම් | ලකුණු |
|---|---|---|
| 01 | සේවා පළපුරුද්ද<br>(අතිරේක සේවා කාල සඳහා) | 40 |
| 02 | අදාළ තනතුරෙහි වැඩ බැලීම | 05 |
| 03 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 |
| 04 | වෘත්තීය සුදුසුකම් | 25 |
| 05 | වෙනත් කුසලතා | 10 |
| | මුළු ලකුණු සංඛ්‍යාව | 100 |

04. අභ්‍යන්තර අයදුම්කරුවන් ස.සේ.කො. 02/2025 චක්‍රලේඛයේ අභ්‍යන්තර බඳවා ගැනීම් සඳහා වන සුදුසුකම් සපුරා නොමැති අවස්ථාවකදී ඒ සඳහා බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සලකා බැලීමට බාධාවක් නොමැත. අභ්‍යන්තර සේවකයන් ලෙස සලකා ලකුණු ගණනය කළ යුත්තේ සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය මත සේවයේ යෙදෙන්නන් සඳහා පමණි.

05. සෑම අයදුම්කරුවෙකුම පූර්ණ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින්ම ඇගයීම් කළ යුතු අතර අභ්‍යන්තර අයදුම්කරුවන්ගේ ලකුණු සටහන් කිරීම සඳහා ඇමුණුම 03 ද බාහිර අයදුම්කරුවන්ගේ ලකුණු සටහන් කිරීම සඳහා ඇමුණුම 04 හි සඳහන් ලේඛනය ද භාවිතා කළ යුතුය. නමුත් ලකුණු අනුපිළිවෙල අනුව අභ්‍යන්තර හා බාහිර අයදුම්කරුවන් සඳහා ඇමුණුම 02 පරිදි වෙන වෙනම ප්‍රමුඛතා ලේඛන සකස් කළ යුතුය.

06. තනතුරට අදාළ මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා උපයෝගී කර ගන්නා ලද අධ්‍යාපන හෝ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා නොදිය යුතුය.

07. මෙම චක්‍රලේඛය වයඹ පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර්ගේ එකඟතාවය ඇතිව නිකුත් කරනු ලැබේ.

කොමිෂන් සභා නියමය පරිදි,

එන්.වී.සෙනෙවිරත්න,
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව(වයඹ).

එන්.වී. සෙනෙවිරත්න
ලේකම්
සමුපකාර සේවක කොමිෂන් සභාව
වයඹ පළාත

<u>පිටපත්:</u>

01.ප්‍රධාන ලේකම් - වයඹ පළාත - කා.දැ.පි.
02.ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය(වයඹ) - කා.දැ.පි.
03.සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් (වයඹ පළාත) - දැ.පි. හා අ.ක.ස.
04.සියලුම සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරු - දැ.පි හා අ.ක.ස.

උපලේඛන 01

## 01. සේවා පළපුරුද්ද (අතිරේක සේවා කාල සඳහා) - උපරිම ලකුණු 40

අභ්‍යන්තර සේවකයෙකු සේ සලකා අදාළ තනතුරට බඳවා ගැනීමේදී සේවා පළපුරුද්ද ලෙස මෙම චක්‍රලේඛයේ බඳවා ගැනීමේ සුදුසුකම් යටතේ සම්පූර්ණ කළ යුතු සේවා කාලය හැර ඉතිරි සේවා කාලය සඳහා පමණක් පහත එක් එක් වැටුප් කේත අංක අනුව උපරිම වශයෙන් ලකුණු 40ක් ලබාදිය හැකිය.

| වැටුප් කේත අංකය | ලකුණු | |
|---|---|---|
| | වසරක සේවා කාලයක් සඳහා | මාස 06 වැඩි වසරකට අඩු සේවා කාලයක් සඳහා |
| MEL | 05 | 2.5 |
| TSL | 04 | 02 |
| SL | 03 | 1.5 |
| OL | 02 | 01 |
| MSSL(T) / MSSL | 01 | 0.5 |

## 02. අදාළ තනතුරෙහි වැඩ බැලීම - උපරිම ලකුණු 05

කොමිෂන් සභා අනුමැතිය මත වැඩ බැලීමේ කාලය සඳහා පමණක් ලකුණු ගණනය කළ යුතුය. මාස 01 ට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

| වැඩ බැලීමේ කාලය | ලකුණු |
|---|---|
| මාස 01 සිට 03 දක්වා | 01 |
| මාස 03ට වැඩි මාස 06 දක්වා | 02 |
| මාස 06ට වැඩි මාස 09 දක්වා | 03 |
| මාස 09 හෝ ඊට වැඩි | 05 |

## 03. අතිරේක අධ්‍යාපන සුදුසුකම් - උපරිම ලකුණු 20

තනතුරට අදාළ මූලික සුදුසුකම් සනාථ කිරීම සඳහා උපයෝගී කර ගන්නා සහතික සඳහා හෝ මූලික සුදුසුකම්වලින් පහළ සුදුසුකම් සඳහා ඉදිරිපත් කරන සහතික සඳහා ලකුණු ලබා නොදිය යුතුය.

### 3.1. අ.පො.ස. (සා.පෙළ) විභාගය - උපරිම ලකුණු 10

දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ.) විභාගය සමත් විය යුතුය. MSSL(T) හෝ MSSL වැටුප් කේත අදාළ වන තනතුරු සඳහා බඳවා ගැනිමේදී පමණක් මෙම සහතික සඳහා ලකුණු ලබා දිය යුතුය.

| සාමාර්ථය | ලකුණු |
|---|---|
| අ.පො.ස. (සා.පෙ.) විභාගයට පෙනී සිටීම | 01 |
| විෂයයන් 01ක් හෝ වැඩි ගණනක සාමාර්ථය | 02 |
| ගණිතය, සිංහල/දෙමළ ඇතුළුව විෂයන් 03කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්වීම | 04 |
| ගණිතය, සිංහල/දෙමළ ඇතුළුව විෂයන් 04කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්වීම | 06 |
| ගණිතය, සිංහල/දෙමළ ඇතුළුව විෂයන් 05කට සම්මාන සහිතව විෂයයන් 06 කින් සමත්වීම | 08 |
| ගණිතය, සිංහල/දෙමළ ඇතුළුව විෂයන් 06ක් හෝ ඊට වැඩි ගණනකට සම්මාන සහිතව විෂයයන් 07කින් හෝ ඊට වැඩි විෂයයන් ගණනකින් සමත්වීම | 10 |

3.2. අ.පො.ස. (උ.පෙ) විභාගය - උපරිම ලකුණු 10
ඕනෑම විෂය ධාරාවකින් එකවර සමත් විය යුතුය.

| සාමාර්ථය | ලකුණු |
|---|---|
| A සාමාර්ථයක් සඳහා | 03 බැගින් |
| B සාමාර්ථයක් සඳහා | 02 බැගින් |
| C සාමාර්ථයක් සඳහා | 01 බැගින් |
| සියළුම විෂයන් සඳහා A සාමාර්ථ | 10 |

3.3 උපාධි පාඨමාලා සහතික - උපරිම ලකුණු 10

| උපාධි සහතිකය | | ලකුණු |
|---|---|---|
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, ඉල්ලුම් කර ඇති විෂය ක්ෂේත්‍රයට අදාළව ලබා ගත් උපාධි සහතිකය | සාමාන්‍ය | 08 |
| | විශේෂ | 10 |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින්, ඕනෑම විෂය ධාරාවක් යටතේ ලබා ගත් උපාධි සහතිකය | | 07 |

## 04. වෘත්තීය සුදුසුකම් - උපරිම ලකුණු 25

4.1 සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය /
සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) සහතිකය /
සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව / - උපරිම ලකුණු 10

| වෘත්තීය සුදුසුකම් | සාමාර්ථය සඳහා ලකුණු | | | | උපරිම ලකුණු |
|---|---|---|---|---|---|
| | පළමු පෙළ | දෙවන පෙළ ඉහළ | දෙවන පෙළ පහළ | සාමාන්‍ය | |
| සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ සමුපකාර සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව | 05 | 04 | 03 | 02 | 05 |
| සමුපකාර සංවර්ධන සහතික පත්‍ර (උසස් පෙළ) සහතිකය හෝ සමුපකාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 05 | 04 | 03 | 02 | 05 |

**4.2 ඉල්ලුම් කර ඇති විෂය ක්ෂේත්‍රයට අදාළව පිළිගත් ආයතනයකින් ලබා ගත් සහතිකපත්‍ර / ඩිප්ලෝමා / උසස් ඩිප්ලෝමා පාඨමාලා - උපරිම ලකුණු - 15**

| පාඨමාලාව | පාඨමාලා කාලය | එක් පාඨමාලාවක් සඳහා ලකුණු | එක් පාඨමාලාවකට වඩා හදාරා ඇත්නම් (පාඨමාලා සංඛ්‍යාව) | ලකුණු සංඛ්‍යාව | උපරිම ලකුණු |
| --- | --- | --- | --- | --- | --- |
| සහතිකපත්‍ර පාඨමාලාව | මාස 06කට නොඅඩු (AAT අදියර I/ IBSL සහතික පත්‍ර පාඨමාලාව) | 01 බැගින් | 02 හෝ ඊට වැඩි | 02 | 05 |
| | මාස 09කට නො අඩු | 02 බැගින් | 02 හෝ ඊට වැඩි | 03 | |
| | වසර 01 හෝ ඊට වැඩි | 03 බැගින් | 02 හෝ ඊට වැඩි | 05 | |
| ඩිප්ලෝමා පාඨමාලාව | මාස 09කට නො අඩු (AAT අදියර II, IBSL ඩිප්ලෝමා | 03 බැගින් | 02 හෝ ඊට වැඩි | 05 | 05 |
| | AAT අදියර III CA අදියර 1 CIMA අදියර 1 | 04 බැගින් | 02 හෝ ඊට වැඩි | | |
| උසස් ඩිප්ලෝමා පාඨමාලාව | වසර 02 හෝ ඊට වැඩි CA අදියර II/ IBSL උසස් ඩිප්ලෝමා පාඨමාලාව/ CIMA අදියර II | 05 බැගින් | 02 හෝ ඊට වැඩි | 10 | 10 |
| | CA /CIMA අදියර සියල්ල සම්පූර්ණ කර තිබීම. | 06 බැගින් | 02 හෝ ඊට වැඩි | | |

## 05. වෙනත් කුසලතා - උපරිම ලකුණු 10

| කුසලතාව / හැකියාව | | කුසලතා මට්ටම | අවස්ථා ගණන | උපරිම ලකුණු |
|---|---|---|---|---|
| 5.1 | ක්‍රීඩා කෞශල්‍යය | පාසැල්/කලාප/පළාත්/ජාතික මට්ටමේ ක්‍රීඩා සහතික | 01 | 01 |
| 5.2 | භාෂා හැකියාව | අ.පො.ස. (සා.පෙ) / (උ.පෙ. )/ ඉංග්‍රීසි/ දෙමළ භාෂාව විෂයයක් ලෙස හදාරා සම්මාන හෝ ඉහළ සාමාර්ථයක් ලබා තිබීම හෝ පිළිගත් ආයතනයකින් ලබාගත් මාස 06 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඉංග්‍රීසි/ දෙමළ භාෂා සහතිකපත්‍ර/ ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබීම. | 01 | 02 |
| | | උපාධිය සඳහා ඉංග්‍රීසි/ දෙමළ භාෂාව විෂයයක් ලෙස හදාරා තිබීම හෝ ඉංග්‍රීසි/ දෙමළ භාෂා මාධ්‍යයෙන් උපාධිය හදාරා තිබීම. | 02 | |
| 5.3 | පරිගණක සාක්ෂරතාව | අ.පො.ස. (සා.පෙ)/(උ.පෙ. )/ විභාගය සඳහා පරිගණක විෂයය හදාරා සම්මාන හෝ ඊට ඉහළ සාමාර්ථයක් ලබා තිබීම හෝ පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත සහතික පත්‍රයක් ලබා තිබීම. | 01 | 04 |
| | | පිළිගත් අයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලා සහතිකයක් ලබා තිබීම හෝ උපාධිය සඳහා අමතර විෂයක් ලෙස පරිගණක විද්‍යාව හදාරා තිබීම. | 02 | |
| | | පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගන්නා ලද උපාධිය සඳහා පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම. | 04 | |
| 5.4 | දහම් පාසැල් සහතික | අවසාන සහතික පත්‍රය හෝ ධර්මාචාරය විභාග සහතිකය | 01 | 01 |
| 5.5 | වෙනත් කුසලතා | කලාප/ පළාත් මට්ටමේ ක්‍රීඩා නොවන ජයග්‍රහණ (සෞන්දර්ය වැනි) | 01 හෝ ඊට වැඩි | 01 |
| 5.6 | නායකත්වය/ පෞරුෂත්වය | පාසල් ශිෂ්‍ය නායක/ ක්‍රීඩා නායක | 01 | 01 |

ඇමුණුම 01

# ලිඛිත විභාගය හා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීම - ඒකාබද්ධ ලේඛනය

තනතුර:.......................................... දිනය: ........................

| අනු අංකය | නම | ජාතික හැඳුනුම්පත් අංකය | මූලික සුදුසුකම් සපුරා ඇත/නැත | විභාග ලකුණු (ප්‍රතිශතය %) | සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගත් ලකුණු (ප්‍රතිශතය %) | මුළු ලකුණු එකතුව | මුළු ලකුණු ප්‍රතිශතය | ප්‍රමුඛතාවය |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

ඉහත සඳහන් අයදුම්කරුවන් ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම නිර්දේශ කරමු.

## සම්මුඛ පරීක්ෂණයේ නිලධාරි මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර | සේවා ස්ථානය | අත්සන |
|---|---|---|---|---|
| 01 | | | | |
| 02 | | | | |
| 03 | | | | |
| 04 | | | | |
| 05 | | | | |
| 06 | | | | |

(නිල මුද්‍රාව තැබීම අත්‍යවශ්‍ය වේ.)

ඇමුණුම 02

# ප්‍රමුඛතා ලේඛනය

............................ අයදුම්කරුවන් සඳහා
(අභ්‍යන්තර/බාහිර ද යන්න සඳහන් කරන්න)

සමිතිය:

තනතුර:

දිනය:

| අනු අංකය | නම හා ජාතික හැඳුනුම්පත් අංකය | ලබා ගත් මුළු ලකුණු ප්‍රතිශතය | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

නිර්දේශය:

විශේෂ කරුණු:

| අනු අංකය | නම හා නිත්‍ය තනතුර | තනතුර | අත්සන | නිල මුද්‍රාව |
|---|---|---|---|---|
| 1. | | | | |
| 2. | | | | |
| 3. | | | | |
| 4. | | | | |
| 5. | | | | |
| 6. | | | | |

(නිල මුද්‍රාව තැබීම අනිවාර්ය වේ.)

ඇමුණුම 04

## සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දීම - බාහිර සේවකයින් සඳහා

තනතුර:.......................................  දිනය:.......................

| නම හා ජාතික හඳුනුම්පත් අංකය | පදිංචිය | තනතුරට අදාළ මූලික අධ්‍යාපන සුදුසුකම්/ සේවා පළපුරුද්ද (02/2025 චක්‍රලේඛයට අනුව) | | අතිරේක අධ්‍යාපන සුදුසුකම්/අතිරේක වෘත්තීය සුදුසුකම් (45) | | | වෙනත් කුසලතා සඳහා 01/2026 චක්‍රලේඛයේ උපලේඛන 01 හි අංක 05 අනුව (උපරිම ලකුණු10) | | | මුළු ලකුණු (A) (උපරිම ලකුණු 55) | ලකුණු ප්‍රතිශතය (100%) * |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | අධ්‍යාපන සුදුසුකම් (සටහන් කරන්න) | සේවා පළපුරුද්ද (සටහන් කරන්න) | අධ්‍යාපන සහතික (20) | වෘත්තීය පාඨමාලා සහතික (25) | ලකුණු | අනු අංකය | කුසලතාවය සටහන් කරන්න | ලකුණු | | |
| | | | | | | | | | | | |

ඉහත නම් සඳහන් අයදුම්කරුවන් ඉදිරිපත් කර ඇති සහතික ඇගයීම් කර නිවැරදිව ලකුණු ලබා දී ඇති බවට සහතික කරමු.

සම්මුඛ පරීක්ෂණ නිලධාරි මණ්ඩලය

| අනු අංකය | නිලධාරියාගේ නම හා නිත්‍ය තනතුර | තනතුර | අත්සන |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |

(නිල මුද්‍රාව තැබීම අනිවාර්ය වේ.)

*ලකුණු ප්‍රතිශතය ගණනය කිරීම $\frac{A \times 100}{55} =$

ඇමුණුම 03

## සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දීම - අභ්‍යන්තර සේවකයින් සඳහා

තනතුර:......................................

දිනය:......................

| නම හා ජාතික හඳුනුම්පත් අංකය | තනතුරට අදාළ මූලික අධ්‍යාපන සුදුසුකම්/සේවා පළපුරුද්ද (02/2025 චක්‍රලේඛයට අනුව) | | අතිරේක සේවා කාලය/අදාළ තනතුරේ වැඩ බැලීම (45) | | අතිරේක අධ්‍යාපන සුදුසුකම්/අතිරේක වෘත්තීය සුදුසුකම් (45) | | | වෙනත් කුසලතා සඳහා 01/2026 චක්‍රලේඛයේ උපලේඛන 01(05) අනුව (10) | | මුළු ලකුණු (100) | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | අධ්‍යාපන සුදුසුකම් (සටහන් කරන්න) | සේවා පළපුරුද්ද (සටහන් කරන්න) | සේවා කාලය (40) | වැඩ බැලීම (05) | අධ්‍යාපන සහතික (20) | වෘත්තීය පාඨමාලා සහතික (25) | ලකුණු | කුසලතාවය සටහන් කරන්න | ලකුණු | | |
| | | | | | | | | | | | |

ඉහත නම් සඳහන් අයදුම්කරුවන් ඉදිරිපත් කර ඇති සහතික ඇගයීම් කර නිවැරදිව ලකුණු ලබා දී ඇති බවට සහතික කරමු.

සම්මුඛ පරීක්ෂණ නිලධාරි මණ්ඩලය

| අනු අංකය | නිලධාරියාගේ නම හා නිත්‍ය තනතුර | තනතුර | අත්සන |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |

(නිල මුද්‍රාව තැබීම අනිවාර්ය වේ.)